Buddhist Era 2547 ll Second Quarter -Monday, November 17,2003



වෙහෙරේ බුදුරුව

එත්සාල් දෙළ

ලැගුම් කුටියක්

## ‘සිත් සනසන සෙනසුන’ - මැරේ කැලේ ශ්‍රී රෝහණ අරණ

### ⁂ සදහම් දැනුම

– වහුමුවේ විජයවංශ හිමි

බුදු දහම හා ඒ ආශ්‍රිත විෂය කරුණු පිළිබඳ ප්‍රශ්න හා කෙටි පිළිතුරු ඇතුළත් – බුදු දහම හදරන සිසුන්ට මෙන්ම වැඩිහිටියන්ට ද ප්‍රයෝ–ජනවත් විශේෂාංගයකි.

### ⁂ ජීවී – අජීවී වස්තු සැමට පොදු ධර්මතාවාදය

– ආචාර්ය හේන්පිටගෙදර ඤාණාවාස නාහිමි

ලොවේ පැවැත්ම සිදු වන විවිධ ස්වභාව නියාම ධර්ම පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්. විදු දැනුමෙන් දියුණු වත්මන් ලොවේ විදු දැනුමට මග පෙන්වන ගැඹුරු ලෝක යථාර්ථ හෙළිකරන එකම දහම බුදු දහම බව.

### ⁂ පෙර භවය දකින්න දියුණු කළ මනසක් ඕනෑ

– පිටිදුවේ සිරිධම්ම හිමි

පුද්ගලයාගේ සසර පැවැත්ම සිදු වන ආකාරය සහ එය දැන ගැනීම සඳහා ඔහු විසින් දියුණු කළ යුතු ඤාණ විශේෂ. වත්මන් අධිමානසික පර්යේෂණ – සත්වයාගේ පුනර්භවය තහවුරු කිරීමට දායක වී ඇති අයුරු.

### ⁂ ලොව සදා පවතින ලක්ෂණ තුනකි තිලකුණු දහම

– කොටුගොඩ ධම්මාවාස අනු නා හිමි

බුදු දහම තුළ සසර පැවැත්මෙහි ස්වභාවය වශයෙන් දක්වා ඇති ප්‍රධාන ස්වභාව ධර්ම ලක්ෂණ තුනක් පිළිබඳ විග්‍රහයකි, මෙම ලිපිය.

### ⁂ සක්මන හෙවත් ඇවිදීම සුව සෙතට හොඳ ව්‍යායාමයක්

– තෙළගපාත ධර්මකීර්ති නාහිමි

නිරෝගී බව රැකගැනීම සඳහා බුදු වදනෙන් ලැබී ඇති මග පෙන්වීම. විශේෂයෙන්, වත්මන් සෞඛ්‍ය විද්‍යාඥයන්ගේ සොයාගැනීම් අනුව – ශරීර සුවය වඩන උසස් මට්ටමේ පොදු ව්‍යායාමයක් වන සක්මන් කිරීම – මෙහි අනුසස් බුදු වදනෙන් පැහැදිලි වී ඇති අයුරු.

### ⁂ බුදුදහම මිනිසා සුමගට යොමු කරන ජීවන මාර්ගයකි

– අත්තුඩාවේ සිරි රාහුල මහ නාහිමි

බුදු දහම පැහැදිලි කර දෙන ජීවිත දර්ශනය අනුව පුද්ගලයා තුළ සදාචාරවත් බව ඇති කිරීමට එයින් ලැබෙන පිටුබලය. බෞද්ධ විමුක්ති මාර්ගයේ අතුරු ඵලයක් ලෙස ගොඩනැගෙන පූර්වාදර්ශී සමාජය තුළ සකස් විය යුතු සදාචාර ධර්ම.

### ⁂ ලෙඩ සුව කරන බෞද්ධ භාවනාව

– මිදිගම සෝරත හිමි

බෞද්ධ භාවනා ක්‍රම භාවිතා කිරීමේ අතුරු ඵලයක් ලෙස සැලකිය හැකි – එහි රෝග නිවාරණ ගුණය පිළිබඳ විමසුමකි. භාවනාව තුළින් ඇති වන චිත්ත පාරිශුද්ධිය හා නීරෝගී බව – සිරුරේ නීරෝගී බවට සවිමත් පදනමක් ලෙස ක්‍රියාකරන අයුරු.

### ⁂ බොරු කීමෙන් වැළැකීම

– උඩුවේ ධම්මාලෝක හිමි

‘දියුණුවේ දෙරටු’ විශේෂාංගය යටතේ මුසාවාදයේ ආදීනව දැක්වෙන බුදු වදන්. බොරු කියන පුද්ගලයාට සහ සත්‍යවාදියාට සමාජය තුළ හිමි වන වටිනාකම්.

### ⁂ උතුම් සැපත ලබන මඟ

– දිවියාගහ යසස්සි හිමි

‘ධම්ම පදයෙන්’ විශේෂාංගය යටතේ ධර්මය තුළින් ජීවිතය දැක – නිවන් සැපතට පත් වීම සඳහා පුද්ගලයා විසින් ක්‍රියාත්මක කළ යුතු වැදගත් පිළිවෙත් කිහිපයක් පිළිබඳ සරල හැඳින්වීමක් ඉදිරිපත් කිරීමට දරන උත්සාහයකි.

### ⁂ කටු ගහ ගල්ගේ රජ මහ විහාරය

– කේ.බී. රත්නායක

මොනරාගල බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් අභාවයට යමින් පවතින ඉපැරැණි ඓතිහාසික විහාරස්ථානයක් පිළිබඳ තොරතුරු මෙම ලිපියෙන් දැක්වේ.

## ⌘ කීඹිකන්දේ ධර්මාශ්‍රමය

– වින්සර් මුණුගොඩ

ගාල්ල දිස්ත්‍රික්කයට අයත් කීඹිකන්ද ප්‍රදේශයේ පිහිටි පැරණි විහාරස්ථානයක් පිළිබඳ තොරතුරු මෙම ලිපියෙන් හෙළි කැරේ.

## ⌘ බෞද්ධ භාරතය

– සිරිසමන් විජේතුංග

භාරතය නොහොත් ඉන්දියාව තුළ බුදු සසුන බිහි වී – ව්‍යාප්ත වීම පිළිබඳ ඓතිහාසික තොරතුරු.

## ⌘ Devotion in Buddhism

***- by Ven. Bhikku Vinayarakkhita***

## ⌘ ඉන්දුනීසියාවේ ථේරවාද සංඝ සභාවේ ස්වර්ණ ජයන්තිය ඉහළින් සැමරේ

ඉන්දුනීසියාවේ ථේරවාද සංඝ සභාවේ ස්වර්ණ ජයන්තිය (ආරම්භයෙන් පනස් වන වර්ෂ පූර්ණය) වප් මස – ඔක්තෝබර 25 වැනිද අති උත්කර්ෂවත් විලාශයෙන් රටේ අග නගරය වන ජාකර්තා නුවරදී ධම්මචක්ක ජය විහාරයේදී පැවැත්විණි. සියම් මහා නිකායේ කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ ප්‍රධාන ලේඛකාධිකාරී මහාචාර්ය බෙල්ලන්විල විමලරතන හිමියෝ උත්සවයේ ප්‍රධාන ආරාධිතයා වශයෙන් ඊට සහභාගි වූහ.

## ⌘ බුදු හිමි අනුදැන වදාළ රාජ්‍ය පාලන ප්‍රතිපත්තිය

– කෝමාරිකේ රාහුල හිමි

රටක – රාජ්‍යයක සංවර්ධනය සලසන නිවැරැදි රාජ්‍ය පාලන ප්‍රතිපත්ති පිළිබඳ බෞද්ධ මඟ පෙන්වීම – බුදු වදන් ඇසුරෙන් පැහැදිලි කර ගැනීමයි, මෙම ලේඛකයාගේ අරමුණ වී ඇත්තේ.